---

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවලට විවෘත පදනමින් බඳවා ගැනීම - 2025**

1. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් **2025 නොවැම්බර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**1.1.** බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01 | ක්‍රියාකරු | 39 | III ශ්‍රේණිය |
| 02 | ට්‍රැක්ටර් ක්‍රියාකරු | 8 | III ශ්‍රේණිය |
| 03 | විදුලි කාර්මික | 7 | III ශ්‍රේණිය |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|---|
| 04 | කාර්මික ශිල්පී | 22 | III ශ්‍රේණිය |
| 05 | පෑස්සුම්කරු | 3 | III ශ්‍රේණිය |
| 06 | බෙලෙක් වැඩකරු | 11 | III ශ්‍රේණිය |
| 07 | පින්තාරුකරු | 5 | III ශ්‍රේණිය |
| 08 | ලියවන පට්ටල්කරු | 2 | III ශ්‍රේණිය |
| 09 | සවිකරන්නා | 4 | III ශ්‍රේණිය |
| 10 | යන්ත්‍රකරු | 4 | III ශ්‍රේණිය |
| 11 | කම්මල්කරු | 3 | III ශ්‍රේණිය |
| 12 | නඩත්තු හා මෙහෙයුම් කම්කරු | 63 | III ශ්‍රේණිය |
| 13 | ජල පොම්ප ක්‍රියාකරු | 10 | III ශ්‍රේණිය |
| 14 | පෙදරේරු | 6 | III ශ්‍රේණිය |
| 15 | වඩු කාර්මික | 4 | III ශ්‍රේණිය |
| 16 | ජල නළ කාර්මික | 1 | III ශ්‍රේණිය |
| 17 | උපකරණ ශිල්පී | 1 | III ශ්‍රේණිය |
| 18 | උපකරණ අලුත්වැඩියාකරු | 2 | III ශ්‍රේණිය |
| 19 | ජල විද්‍යා මිනුම් සහායක | 26 | III ශ්‍රේණිය |
| 20 | සංචාරක බංගලා භාරකරු | 5 | III ශ්‍රේණිය |
| 21 | ගබඩා කම්කරු(ගබඩා සහායක) | 30 | III ශ්‍රේණිය |
| 22 | වැද්දුම්කරු | 2 | III ශ්‍රේණිය |

**1.2. තනතුරුවල රාජකාරි ස්වභාවය :**

| තනතුරු නාමය | කාර්යයන් |
|---|---|
| ක්‍රියාකරු | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ලොරි, ක්‍රෝලර්, ට්‍රැක්ටර්, රබර් ටයර් සහිත ට්‍රැක්ටර්, ඩම්ප් ට්‍රක්, බකට් ස්ක්‍රේපර්, රෝඩ් රෝලර් මෝටර් ග්‍රේඩර්, බර පටවන ලොඩර්, බැක්හු එක්ස්කැවේටර් වර්ග (ෂවර්/ඩ්‍රැග් ලයින්/බැක්හු/ ක්ලෑම් ෂෙල්/ ක්‍රේන්/ෆයිල් ඩයිවර්) ඩෝසර් යන යන්ත්‍රවලින් ඕනෑම යන්ත්‍ර 3ක් ක්‍රියා කරවීම පිළිබඳව පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම:-<br><br>I. සර්විස් කිරීම හා වැරදි සොයා ගැනීම ඇතුලුව එය ක්‍රියාකරවීම ආරක්ෂා කිරීම හා තබා ගැනීම පිළිබඳව දැනීමක් තිබීම;<br><br>II. පස් අදින උපකරණ හා යන්ත්‍ර ක්‍රියාකරවන්නන් සඳහාවන සියලුම පරීක්ෂණවල දී යන්ත්‍රය කාර්යක්ෂම ලෙස ක්‍රියාකරවීමට හැකිවීම;<br><br>III. විශේෂ ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ අදාළ යන්ත්‍රය භාවිතය පිළිබඳ දැනුමක් තිබීම;<br><br>IV. පස් බුරුල් කිරීමට, පස් කැපීමට, පැටවීමට, තල්ලු කිරීමට හා ඇදීමට භාවිතා කරනු ලබන උපකරණ පිළිබඳව දැනීමක් තිබීම;<br><br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

| *තනතුරු නාමය* | | *කාර්යයන්* |
|---|---|---|
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | I. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රාජකාරිවලට අනුකූලව ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා භාවිතා කරන ට්‍රැක්ටර් රථ ක්‍රියා කරවීම |
| | II. | ට්‍රැක්ටර් හා ට්‍රේලර් රථ සර්විස් කිරීම, වැරදි සොයා ගැනීම ඇතුළුව ඒවා ක්‍රියාකරවීම, ආරක්ෂාකාරීව තබා ගැනීම පිළිබඳ දැනුමක් තිබීම |
| | III. | ට්‍රැක්ටර් රථ පැදවීම, ට්‍රේලරයට බර පැටවීම හා එම බර බෑම යනා දී සියලුම පරීක්ෂණවල දී කාර්යක්ෂම ලෙස ක්‍රියා කරවීමට හැකි වීම |
| | IV. | කඳු බෑවුම්, වගුරු බිම් වැනි ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ ක්‍රියා කරවීම පිළිබඳ හැකියාවක් තිබීම |
| | V. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| විදුලි කාර්මික | I. | 1/64" පරිමාණයන් කියවීමට පුලුවන් වීම |
| | II. | වෘත්තියට අදාළ ආයුධවල නම් භාවිතය හා ඒවා තබාගැනීම පිළිබඳ දැනීම |
| | III. | සරල රූප සටහන් කියවා තේරුම් ගැනීමට පුලුවන් වීම |
| | IV. | මෝටර් රථයක තිබෙන විදුලි කොටස් පිළිබඳ දැනීම |
| | V. | සියලු වැඩවල දී පිළිපැදිය යුතු ආරක්ෂක උපදෙස් පිළිබඳ දැනීම |
| | VI. | වයර් කිරීමේ වැඩ ( විදුලි ජේනු ) පිළිබඳ දැනීම |
| | VII. | සියලුම වර්ගවල ගෘහ සේවා මීටර් කියවීමට හා උපරිම ඉල්ලුම් සුචක නැවත සකස් කිරීමට පුලුවන් වීම |
| | VIII. | දෙපාර්තමේන්තුවේ පිළිපදින ආරක්ෂාව පිළිබඳ සියලු නීති සම්බන්ධයෙන් ප්‍රවීණතාවයක් තිබීම |
| | IX. | ගණක මීටරවල ක්‍රියාකාරීත්වය පිළිබඳ මනා දැනීම |
| | X. | සරල ගණනය පිළිබඳ දැනීම |
| | XI. | යන්ත්‍ර, වාහන, ශෘහස්ථ විදුලි පරිපථ පිළිබඳ අලුත්වැඩියාවන්, දෝෂ හා ඒවාට හේතු සොයා ගැනීමේ හැකියාව පිළිබඳ පළපුරුද්දක් තිබීම |
| | XII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| කාර්මික ශිල්පී | I. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවත්නා මෝටර් වාහන, යන්ත්‍ර සූත්‍ර, පොම්පාගාර සහ විවිධාකාර මැෂින්වලට අවශ්‍යවන අලුත්වැඩියාවන් කිරීම. |
| | II. | දෝෂයන් ඇති අවස්ථාවල දී එම දෝෂයන් සොයා ගැනීමේ අවශ්‍යතාවය හා හැකියාව. |
| | III. | දෝෂයන් පවත්නා උපාංග සොයා ගැනීමේ හැකියාව සහ එම උපාංග මිල දී ගැනීම හෝ අලුත්වැඩියාව සඳහා නිර්දේශ කිරීම. |
| | IV. | අලුත් උපාංග යොදා එම දෝෂයන් යථා තත්ත්වයට පත්කිරීමේ හැකියාව. |
| | V. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

| *තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| පැස්සුම්කරු | I. පැස්සුම් වැඩවල දී භාවිතා කරන විවිධ වර්ගවල උපකරණ ඒවාට අදාළ කාර්යයන් සඳහා නිවැරදිව භාවිතා කරමින් පැස්සුම් කටයුතු සිදුකිරීම.<br>II. යකඩ හා යකඩ නොවන ලෝහවල වෙනස හඳුනාගෙන ඒ අනුව නිවැරදි පැස්සුම් කටයුතු සිදු කිරීම.<br>III. පැස්සුම් කටයුතු සිදු කිරීමේ දී යෙදිය යුතු ආරක්ෂක උපදෙස් නිසි පරිදි භාවිතා කිරීම.<br>IV. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| තහඩුවැඩකරු (බෙලෙක් වැඩකරු) | I. 1/32" පරිමාණයන් කියවීමට හැකිවීම.<br>II. වෘත්තියෙහි දී භාවිතා කෙරෙන විවිධ ලෝහ වර්ග පිළිබඳ මනා දැනීමක් තිබීම.<br>III. ඊයම්වලින් පැස්සීම, වෙනත් ලෝහවලින් පැස්සීම හා රිවට් කිරීම පිළිබඳ මනා දැනුමක් තිබීම.<br>IV. වාත්තු කරන වක්‍ර කපන යන්ත්‍ර ක්‍රියා කරවීමට හැකිවීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| පින්තාරුකරු | I. කියවීමට හා ලිවීමට පුලුවන් වීම.<br>II. පින්තාරු කරන ලද පරණ පෘෂ්ඨ ධමන ලාම්පුව, සිරීම හා පින්තාරු ඉවත්කරනය යන ක්‍රම මගින් ශුද්ධ කිරීමට පුලුවන් වීම.<br>III. විවිධ වර්ගවල තීන්ත හා වාර්නිෂ් පිළිබඳ මූලික දැනුම<br>IV. ලෝහමය ලී හා පෘෂ්ඨ ශුද්ධ කර පින්තාරු කිරීමට හා පින්තාරු කරන උපකරණ සියල්ලම භාවිතා කිරීමට හැකියාව තිබීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| ලියවන පට්ටල්කරු | I. පට්ටල් වැඩ සඳහා අදාළවන ආයුධ හඳුනා ගැනීම.<br>II. ලියවන පට්ටල්වලින් කෙරෙන කාර්යයන් පිළිබඳ මනා අවබෝධයෙන් කටයුතු කිරීම.( කැපීමේ වේග හා ෆීඩ් පිළිබඳ වක්‍ර යෙදීම ඇතුළුව )<br>III. පට්ටල් වැඩ සඳහා ලබාදෙන සරල ඇඳීම් කියවීම.<br>IV. ව'නියර් හා මයික්‍රොමීටර්වලින් මිණුම් කියවීම හා ඒ අනුව පට්ටල්වලින් ලියවීම ( කැපීම ) සිදුකිරීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| සවිකරන්නා | I. 1/64" පරිමාණයන් කියවීමට හා භාගවලින් දැක්වෙන දිග පළල ආදිය සටහන් කිරීම, සූක්ෂම මානය කියවීම පිළිබඳ දැනුම.<br>II. තම වෘත්තියට අදාළවන සියලුම ආයුධවල නම් භාවිතය හා තබා ගැනීම පිළිබඳ මනා දැනීමක් තිබීම |

| *තනතුරු නාමය* | | *කාර්යයන්* |
|---|---|---|
| | III. | වාෂ්ප මොටෝ ඩීසල් හා විල්රයිට් බදු විශේෂ ආකාරවල වැද්දුම් වැඩ පිළිබඳ මනා දැනීමක් තිබීම |
| | IV. | කාර්යක්ෂම අයුරින් සැසීමට හා පීරිගෑමට හැකිවීම |
| | V. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| යන්ත්‍රකරු | I. | මිලින් මැෂින්, ග්‍රයින්ඩින් මැෂින්, ෂේපින් මැෂින්, බෝරින් මැෂින් යනාදී දෙපාර්තමේන්තු කම්හල් තුළ භාවිතා කරන යන්ත්‍ර අතරින් යටත් පිරිසෙයින් යන්ත්‍ර දෙකක්වත් කාර්යක්ෂමව ක්‍රියා කරවීම. |
| | II. | ඉහත යන්ත්‍ර සඳහා සවිවන විවිධ උපාංග සවිකර ක්‍රියා කරවීම |
| | III. | ඉහත යන්ත්‍ර සඳහා අදාළවන විවිධ ආයුධ පරිහරණය කිරීම. |
| | IV. | ඉහත යන්ත්‍ර වලින් සිදු කරගන්නා කාර්යයන් සඳහා ලබාදෙන සරල ඇඳීම් කියවීම. |
| | V. | වර්නියර්, මයික්‍රෝමීටර්වලින් මිනුම් කියවීම හා එම මිනුම්වලට අදාළ ව ඉහත යන්ත්‍ර භාවිතයෙන් අවශ්‍ය කාර්යය නිමා කිරීම. |
| | VI. | දෙපාර්තමේන්තුවට අයත් තම සේවය කරන කම්හල තුළ සවිකර ඇති ඉහත යන්ත්‍ර හා ඒ සඳහා භාවිතා කරන අනෙකුත් සවිකිරීම් හා උපාංග තමා භාරයේ තබාගෙන පාවිච්චි කිරීම හා ආරක්ෂා කිරීම. |
| | VII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| කම්මල්කරු | I. | කියවීමට හා ලිවීමට පුලුවන් වීම. |
| | II. | කම්මල් වැඩ සඳහා අවශ්‍ය ආයුධ පිළිබඳ දැනීම |
| | III. | සිය වෘත්තියට අදාලවන ආයුධවල නම් භාවිතය හා ඒවා තබාගැනීම පිළිබඳව පුරුද්දක් තිබීම. |
| | IV. | වෘත්තියේ දී බෙහෙවින් පාවිච්චි කෙරෙන ලෝහ වර්ග හා අනෙකුත් ද්‍රව්‍ය පිළිබඳ දැනුමක් තිබීම. |
| | V. | ගිනි උදුන් ගොඩනගන හා තබා ගන්නා ආකාරය පිළිබඳ දැනුමක් තිබීම. |
| | VI. | සාමාන්‍ය ලෝහ තැලීම පිළිබඳ දැනීමක් තිබීම |
| | VII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| නඩත්තු හා මෙහෙයුම් කම්කරු | I. | මහා/මධ්‍යම පරිමාණ ජලාශවල වැව්බැම්ම, සොරොව්ව, වාන් නිර්මිතවල නඩත්තු කටයුතු හා මෙහෙයුම් නිතිපතා කිරීම. |
| | II. | ජල පාලන කටයුතුවල නිරත වීම. |
| | III. | මෝසම් වැසි සහිත කාලවල වාරිමාර්ග පද්ධති මුලස්ථායි වැඩ හා වාරිමාර්ග පද්ධති ගංවතුරින් ආරක්ෂා කර ගැනීම, වාරිමාර්ග පාලන දොරටු නිසි පරිදි ආරක්ෂා සහිතව විවෘත කිරීම. |
| | IV. | ප්‍රධාන හා බෙදුම් ඇළ මාර්ග කැළෑ ශුද්ධ කිරීම, සුළු පරිමාණ අළුත්වැඩියාවන්, දොරටු වල යාන්ත්‍රික කොටස් තෙල් හා ග්‍රීස් යෙදීම, මළ ඉවත් කරන තීන්ත ආලේප කිරීම. |

| තනතුරු නාමය | | කාර්යයන් |
|---|---|---|
| නඩත්තු හා මෙහෙයුම්කරු | V. | කෘෂි කාර්මික මාර්ග හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් හා නඩත්තු කිරීම් කටයුතු කිරීම. |
| | VI. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| ජල පොම්ප ක්‍රියාකරු | I. | පොම්පය නිසි පරිදි ක්‍රියා කරවීම. |
| | II. | විදුලිය පිළිබඳ ආරක්ෂණ ක්‍රම පිළිබඳ දැන ගැනීම. |
| | III. | පොම්පය පණ ගැන්වීම හා නැවැත්වීම. |
| | IV. | පොම්පය සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් යෙදීම. |
| | V. | පොම්පවල සුළු කාර්මික දෝෂයන් අලුත්වැඩියා කිරීම. |
| | VI. | පොම්පාගාරයේ සවිකර ඇති විදුලි මෝටර් සහ එන්ජින් ක්‍රියාකරවීම. |
| | VII. | දිවා හෝ රාත්‍රී වශයෙන් මුරසේවා දෙකක් යටතේ කටයුතු කිරීමට හැකිවීම. |
| | VIII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| පෙදරේරු | I. | ඉදිකිරීමට අදාළ නිර්මිත සඳහා වූ සටහන් කියවීම. |
| | II. | ඉදිකිරීමට අදාළ නිර්මිත වූ සටහන් ලියා ඉදිරිපත් කිරීමට හැකිවීම |
| | III. | ගඩොල් 1/20 සම්පූර්ණ ගඩොලට හා ගඩොලට 1 ½ ට සාදනු ලබන සාමාන්‍ය මුලු හා උළුවහු ඇතුළත් ගඩොල් නිර්මිත ඉදිකිරීමට හැකිවීම. |
| | IV. | සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන කපරාරු මිශ්‍රණ පිළියෙල කිරීම හා කපරාරු කිරීමට හැකිවීම. |
| | V. | සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන කොන්ක්‍රීට් මිශ්‍රණ පිළියෙල කිරීම හා ඒවායින් නිර්මිත ඉදිකිරීම් කිරීමට හැකිවීම. |
| | VI. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| වඩු කාර්මික | I. | කියවීමට හා ලිවීමට හැකිවීම |
| | II. | 1/16" පරිමාණයන් කියවීමට හැකිවීම. |
| | III. | දැව නිර්මාණ ආශ්‍රිතව ඔහුව යෙදවීමට බලාපොරොත්තුවන ආකාරයේ වැඩ පිළිබඳ මනා පුරුද්දක් තිබීම. |
| | IV. | විවිධ වර්ගවල ලීවල ගුණ හා භාවිතය පිළිබඳ දැන සිටීම. |
| | V. | විවිධ වර්ගවල පිරිද්දුම්වල නම් හා භාවිතය ද ඒවා සකස් කරන ආකාරය ද දැන සිටීම. |
| | VI. | සිය වෘත්තියට අදාළ වන සරල ඇඳීම් කියවීමට හැකියාවක් තිබීම. |
| | VII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

| *තනතුරු නාමය* | | *කාර්යයන්* |
|---|---|---|
| ජල නළ කාර්මික | I. | ජල නළ හා උපාංග සවිකිරීම. |
| | II. | ජල නළ හා උපාංග නඩත්තු කිරීම. |
| | III. | ජල නළ පද්ධති හා අදාල අවශ්‍ය කොටස් සෑදීම |
| | IV. | වාරිමාර්ග අධ්‍යක්ෂ ( ජල ශක්ති/ප්‍රධාන ඉංජිනේරු/වාරිමාර්ග ඉංජිනේරු/උපකරණ අධිකාරි/සහකාර උපකරණ අධිකාරි/පරේයේෂණ සහකාර) විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| උපකරණ ශිල්පී | I. | මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීම, නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කිරීම හා නඩත්තු කිරීම |
| | II. | අනෙකුත් උපකරණ අලුත්වැඩියා කිරීම හා නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කිරීම හා නඩත්තු කිරීම |
| | III. | උපකරණ අලුත්වැඩියා කිරීමේ දී අදාළ කොටස් අවශ්‍ය කොටස් සෑදීම |
| | IV. | ජලශක්ති අංශයේ ඉහළ නිලධාරින්ගේ උපදෙස් අනුව උපකරණ අලුත්වැඩියාකරුවන් හට උපකරණ අලුත්වැඩියාවන්හිදී ඇතිවන ගැටළු සඳහා උපදෙස් ලබාදීම. |
| | V. | වාරිමාර්ග අධ්‍යක්ෂ ( ජල ශක්ති/ ප්‍රධාන ඉංජිනේරු/වාරිමාර්ග ඉංජිනේරු/ උපකරණ අධිකාරි/සහකාර උපකරණ අධිකාරි/පරේයේෂණ සහකාර) විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| උපකරණ අලුත්වැඩියාකරු | I. | සූක්ෂම මානයන් කියවීමට පුලුවන් වීම. |
| | II. | මීටරයක ක්‍රියාකාරීත්වය හා සම්බන්ධයෙන් ක්‍රියාකාරීවන මූලධර්ම පිළිබඳ සාමාන්‍ය හැඟීමක් තිබීම. |
| | III. | දෝෂ සහිත ඕනෑම මීටරයක හෝ ගේජ් එකක තිබෙන දෝෂය සොයාගෙන එය හරි ගැස්සවීමට පුලුවන් වීම. |
| | IV. | 1/32" පරිමාණයන් හා වෙනත් තම වෘත්තියට අදාළ පරිමාණයන් කියවීමට හැකිවීම. ව්‍යාපෘතියේ දී භාවිතා කරන සුළු සුළු ආයුධවල භාවිතය පිළිබඳ දැනීමක් තිබීම. |
| | V. | අදාළවන මෙවලම් හා ගේජ් වර්ග හඳුනා ගැනීමට පුලුවන් වීම. |
| | VI. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| ජල විද්‍යා මිනුම් සහායක | I. | තම සේවා මුරය තුළ සෑම පැයකට වරක් හෝ උපදෙස් දී ඇති පරිදි වෙනස් කාල පරාසයන් තුළ හෝ අදාළ ගංගාවල ජල මට්ටම් කියවා ලකුණු කිරීම. |
| | II. | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාරවරුන් විසින් විසර්ජන මිනුම් සහ අනෙකුත් භූගෝලීය මිනුම් කරන අවස්ථාවල අවශ්‍ය සියලුම සහය ඔවුන්ට ලබාදීම. |
| | III. | ජල මිනුම් ස්ථානවල සවිකර ඇති සහ එම ස්ථානයට නිකුත් කර ඇති සියලුම රජයේ උපකරණ සහ ද්‍රව්‍යවලට ආරක්ෂාව සැලසීම සහ ඒවා මනාව නඩත්තු කිරීම |

| *තනතුරු නාමය* | | *කාර්යයන්* |
|---|---|---|
| ජල විද්‍යා මිනුම් සහායක | IV. | ජල මිනුම් ස්ථානයට අයිති භූමිය, ගොඩනැගිලි, මිනුම් කණු මනාව නඩත්තු කර පිරිසිදුව තබා ගැනීම. |
| | V. | ජල මිනුම් ස්ථානයට අයිති වෙනත් කාලගුණික උපකරණ ඇත්නම් ඒවායේ මිනුම් කියවා වාර්තාගත කිරීම. |
| | VI. | ක්ෂේත්‍ර ගංගා ජල මිනුම් සහ වර්ෂාමාපක දත්තයන් ජල විද්‍යා අංශයෙන් පිළියෙල කර සපයන ලද මුද්‍රිත පෝරමවල ලකුණු කිරීම. |
| | VII. | ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ගංගාවල දිග, පළල මට්ටම ගැනීම වැනි මිනුම් කටයුතු කිරීමේ දී අවශ්‍ය සහය ලබා ගැනීම. |
| | VIII. | ගුවන් විදුලි පණිවිඩ හුවමාරු යන්ත්‍ර ක්‍රියා කරවීම. |
| | IX. | හදිසි තත්වයක දී එනම් උපකරණ ක්‍රියාවිරහිතවීමක දී හෝ තදබල වර්ෂාපතනයක දී හෝ ගංවතුර තත්වයක දී ඒ බව ජල විද්‍යා අංශය වෙත දැනුම් දීම. |
| | X. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| සංචාරක බංගලා භාරකරු | I. | සංචාරක බංගලාව පිරිසිදු කර පවත්වා ගැනීම. |
| | II. | සංචාරක බංගලාව, එහි පරිශ්‍රය හා ඊට ආනුෂාංගිකවන සියළු දේපළ ආරක්ෂා කිරීම හා නිසි පරිදි නඩත්තු කිරීම. |
| | III. | සංචාරක බංගලාවට පැමිණෙන නීත්‍යානුකූල ආගන්තුකයන්ට අදාළ පරිදි නවාතැන්, ආහාර පාන හා වෙනත් සුදුසු පහසුකම් සැලසීම. |
| | IV. | රාජකාරියට අදාළ බිල් පොත්, ලේඛන යනාදිය නිසි පරිදි පවත්වාගෙන යාම හා අධීක්ෂණ නිලධාරියා වෙත සුදුසු අවස්ථාවල ඉදිරිපත් කිරීම. |
| | V. | සංචාරක බංගලාවට අයත් බඩු බාහිරාදිය භාරව සිටීම |
| | VI. | මෙම තනතුර පැය 24ම වගකීම දරන අදාළ පරිශ්‍රයේ පදිංචිව රාජකාරි කළ යුතු තනතුරක් වේ. |
| | VII. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| ගබඩා කම්කරු (ගබඩා භාරකරු) | I. | බඩු පැටවවීම, බෑම, හෝ එසවීම, අට්ටි ගැසීම හෝ තැන්පත් කිරීම හා ඇසිරීම. |
| | II. | ගබඩාවේ ඇති භාණ්ඩ හඳුනා ගැනීම. |
| | III. | ගබඩාවල ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ අමතර කොටස් භාවිතයෙන් පසු ඉවත් කරන තෙක් රඳවා ගත යුතු අබලි ද්‍රව්‍ය සුරක්ෂිතව තබා ගැනීම. |
| | IV. | ගබඩා භාරකරුගේ රාජකාරි කටයුතුවලට හා ලේඛන පවත්වා ගැනීමට සහාය දීම. |
| | V. | ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

| *තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| වැද්දුම්කරු | I. 1/64" පරිමාණයන් කියවීමට හා භාගවලින් දැක්වෙන දිග පළල ආදිය සටහන් කිරීම, සූක්ෂම මානය කියවීම පිළිබඳ දැනුම.<br>II. තම වෘත්තියට අදාළවන සියලුම ආයුධවල නම් භාවිතය හා ඒවා තබා ගැනීම පිළිබඳ දැනීමක් තිබීම.<br>III. වාෂ්ප මොටෝ ඩීසල් හා විල්රයිට් බදු විශේෂ ආකාරවල වැද්දුම් වැඩ පිළිබඳ මනා දැනීමක් තිබීම.<br>IV. කාර්යක්ෂම අයුරින් සෑසීමට හා පිරිගැමට හැකිවීම.<br>V. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

**02.** **බඳවා ගැනීමේ ක්‍රමය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනේ. එම සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක භාවිතා කරමින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 25 |
| පළපුරුද්ද | 40 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 |
| **එකතුව** | 100 |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගත් කුසලතාවයේ අනුපිළිවෙළ මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**03.** **වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි PL 02-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය
රු. 41,800-10X490-10X540-12X590-12X630- රු.65,560/- වේ.

එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වන අතර පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට එම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**04.** **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

I. මෙම පත්වීම ස්ථිරය. එතකුදු වුවත් ඔබ වර්ෂ තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

III. අදාළ තනතුරේ ස්ථිර කිරීම සඳහා III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවන් නියමිත කාලය තුළ ලබාගත යුතුය.

V. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන හා එයට වරින්වර කරනු ලබන සංශෝදනවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලැබේ.

**05. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**06.අවශ්‍ය සුදුසුකම් :**

6.1 අධ්‍යාපන සුදුසුකම් -

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.;

*හෝ*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2016 අනුව ජාතික වෘත්තීය සුදුසුකම (NVQ 3) සම්පූර්ණ කර තිබීම.

6.2 වෘත්තීය සුදුසුකම් -

| *තනතුරු නාමය* | *තනතුරට අදාළ ශිල්පීය නිපුණතා* |
|---|---|
| ක්‍රියාකරු | I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම.(යන්ත්‍රෝපකරණ පිළිබඳ)<br>II. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ A පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.<br>III. බර වාහන හා යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම, නඩත්තු කිරීම පිළිබඳව අවම වශයෙන් අවු.03ක ප්‍රායෝගික පුහුණුවක් තිබීම. |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ A පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. |
| විදුලි කාර්මික | I. යන්ත්‍ර හා වාහනවල විදුලිමය අලුත්වැඩියාවන් පිළිබඳ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක NVQ 2 හෝ ඊට ඉහළ මට්ටමේ විදුලි කාර්මික ශිල්පය පිළිබඳ මාස 06ක හෝ ඊට වැඩි පුහුණු සහතිකයක් ලබා තිබීම;<br>II. මෙකාට්‍රොනික් පිළිබඳව මාස 06ක පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම. |
| කාර්මික ශිල්පි | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් යන්ත්‍ර හා වාහන අලුත්වැඩියාව සම්බන්ධයෙන් ලබාගෙන තිබීම. |
| පෑස්සුම්කරු | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් පෑස්සුම් ශිල්පය පිළිබඳව ලබාගෙන තිබීම. |

| *තනතුරු නාමය* | *තනතුරට අදාළ ශිල්පීය නිපුණතා* |
|---|---|
| තහඩු වැඩකරු (බෙලෙක් වැඩකරු ) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් තහඩු/බෙලෙක් වැඩ පිළිබඳව ලබාගෙන තිබීම. |
| පින්තාරුකරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් පින්තාරු ශිල්පය පිළිබඳව ලබාගෙන තිබීම. |
| ලියවන පට්ටල්කරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලියවන පට්ටල් ශිල්පය පිළිබඳව ලබාගෙන තිබීම. |
| සවිකරන්නා | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් සවිකිරීම් පිළිබඳව ලබාගෙන තිබීම. |
| යන්ත්‍රකරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් යකඩ කැපීම, ලියවීම පිළිබඳව ලබාගෙන තිබීම. |
| කම්මල්කරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් කම්මල් වැඩ පිළිබඳව ලබාගෙන තිබීම. |
| නඩත්තු හා මෙහෙයුම් කම්කරු | මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා භාවිතා කරන කුඩා යන්ත්‍රෝපකරණ යොදා වැව් බැම්ම, ඇළ මාර්ග හා වාරි පද්ධති අදාළ ප්‍රමිතීන්ට අනුකූලව නඩත්තු කිරීම හා එම යන්ත්‍ර නඩත්තු කිරීම, ජලය නිකුත් කිරීමට අදාළ පාලන නිර්මිතවල කෙරෙන නඩත්තු වැඩ නිර්මිතවල ගේට්ටු ක්‍රියාත්මක කිරීම වශයෙන් තනතුරට පැවරෙන වැඩ කටයුතුවලට සමාන වැඩ කටයුතු පිළිබඳව පිළිගත් ආයතනයක මාස 6ක හෝ ඊට වැඩි පුහුණු සහතිකයක් ලබා තිබීම. |
| ජල පොම්ප ක්‍රියාකරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ජල පොම්ප ක්‍රියාකරණය පිළිබඳව හෝ මෝටර් කාර්මික ශිල්පය පිළිබඳව මාස 03කට නොඅඩු පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම. |
| පෙදරේරු | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ පෙදරේරු වෘත්තිය පිළිබඳ මාස 06ක හෝ ඊට වැඩි පුහුණු සහතිකයක් ලබා තිබීම. |
| වඩු කාර්මික | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ වඩු කාර්මික වෘත්තිය පිළිබඳ මාස 06ක හෝ ඊට වැඩි පුහුණු සහතිකයක් ලබාගෙන තිබීම. |
| ජලනළ කාර්මික | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ ජලනල කාර්මික ශිල්පය පිළිබඳ මාස 06ට නොඅඩු පාඨමාලාවක් සාර්ථකව නිමකර තිබීම. |

| *තනතුරු නාමය* | *තනතුරට අදාළ ශිල්පීය නිපුණතා* |
|---|---|
| උපකරණ ශිල්පී | ජාතික තාක්ෂණ සහතික විභාගය (NCT) හෝ ඒ හා සමාන විභාගයකින් සමත්වී තිබීම හා ක්ෂේත්‍රයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක වසර 02කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. |
| උපකරණ අලුත්වැඩියාකරු | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ උපකරණ අලුත්වැඩියාව පිළිබඳ මාස 06ට නොඅඩු පාඨමාලාවක් සාර්ථකව නිමකර තිබීම |
| ජල විද්‍යා මිනුම් සහයක | රජයේ හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ඉංජිනේරු සමාගමක කාලගුණික උපකරණ කියවීම (වර්ෂාමාණ ආදිය) සම්බන්ධයෙන් හෝ මිනින්දෝරු කම්කරුවකු වශයෙන් අවම වශයෙන් අවුරුදු 03ක පළපුරුදු සහතිකයක් ලබා තිබීම. |
| සංචාරක බංගලා භාරකරු | හෝටල් පාසල මගින් ගෘහ පාලනය හෝ සූප ශාස්ත්‍රය පිළිබඳව පවත්වන මාස 06ක පාඨමාලාවක් හදාරා ලත් සහතිකය; *හෝ* |
| | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් පවත්වන ගෘහ පාලනය හෝ සූපවේදය පිළිබඳ මාස 06ක පාඨමාලාවක් හදාරා ලත් සහතිකය; |
| | *හෝ* තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ ගෘහ පාලනය හා සූපවේදය පිළිබඳව මාස 06ක පාඨමාලාවක් හදාරා තිබීම |
| ගබඩා කම්කරු (ගබඩා සහයක) | ගබඩා ද්‍රව්‍ය පරිගණකගතකර, ගබඩා දත්ත පහසුවෙන් ලබා ගැනීමට බලාපොරොත්තුවන නිසා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක ශිල්පීය නිපුණතා සහතිකයක් ලබා තිබීම. |
| වැද්දුම්කරු | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( NVQ ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් වැද්දුම් ශිල්පය පිළිබඳව ලබාගෙන තිබීම. |

6.3 පළපුරුද්ද - තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

6.4 කායික සුදුසුකම්: -

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6.5. වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරුවන් 05 හා 06 වන ඡේදවල සඳහන් සුදුසුකම් **2025 ඔක්තෝබර් මස 26 දින හෝ ඊට පෙර** සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබේනම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමග ඇමිණිය යුතුය.

**7. අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :**

I. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21x29 ( A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතුය. අංක 1 සිට 3 දක්වා පළමු පිටුවේද, අංක 4 සිට 5 දක්වා දෙවන පිටුවේ ද, අංක 6 සිට 8 දක්වා තෙවන පිටුවේ ද, අංක 9 සිව්වන පිටුවේ ද ඇතුළත්වන පරිදි ඉල්ලුම්පත්‍ර සැකසිය යුතු ය.

II. අයදුම්පත් සකස් කළ යුත්තේ තමා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් පමණි.

III. තනතුරු එකකට වැඩි ප්‍රමාණයක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

IV. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී එක් අයදුම්පතක් සඳහා අයදුම්පත් හා සම්මුඛ පරීක්ෂණ ගාස්තු වශයෙන් රු. 500/- ක මුදලක් ගෙවීම අනිවාර්යය වේ. එය ලංකා බැංකුව, රෝහල පාර, කොළඹ 01, තැප්‍රොබේන් ශාඛාවේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 7042385 දරන ගිණුමට බැරවන පරිදි ගෙවා රිසිට්පත අයදුම්පත්‍රයේ අලවා එවිය යුතු ය.

V. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

VII. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නිකුත් කරන ලිපි අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

VIII. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරවාගෙන යොමු කළ යුතු ය.

IX. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව **"වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ ................තනතුර සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම - 2025"** යනුවෙන් පැහැදිලිව සඳහන් කර **<u>2025 ඔක්තෝබර් මස 26 දින හෝ ඊට පෙර</u>** වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, **වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අංක 230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතු ය.

**8. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අයදුම්පත්‍රය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය බව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් පත්වීම අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**9. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම :**

**<u>2025 නොවැම්බර් මස කොළඹ දී</u>** පමණක් සිංහල හා දෙමළ මාධ්‍යවලින් සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

ඉංජි. අජිත් ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2025 සැප්තැම්බර් මස 25 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.